වේරුගල් ප්‍රාදේශිය සභාව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

--------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 28 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ 2013 ජුනි 21 දිනද විගණනයට ඉදිරිපත් කරන තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ සංශෝධිත මූල්‍ය ප්‍රකාශ 2015 නොවැම්බර් 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 මාර්තු 30 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයෙන් දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2013 දෙසැම්බර් 31 දිනට වෙරුගල් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිනුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කොම්පෝසට් පොහොර නිෂ්පාදනය සඳහා ගෙවිය යුතු තථ්‍ය මුදල් ප්‍රමාණය රු.198,475 ක් වුවද මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණු මුදල රු.498,475 ක් විය. එමනිසා එම මුදල රු.300,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා රෝඩ් රෝලර් කුලී ආදායම වූ රු.80,000 ක් මූල්‍ය ප්‍රකාශයන්හි ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) 2008-2013 වර්ෂයන්හිදී සභාවේ සභාපතිවරයාට සේවකයන්ට සහ ආයතනයන්ට ගෙවන ලද එකතුව රු.585,783 ක් වූ අත්තිකාරම් අයකර ගෙන නොතිබුණි.

(ආ) වර්ෂ 04 කට අධික කාලයක් හිඟව තිබූ එකතුව රු.1,046,670 ක් වූ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 05 කට අධික කාලයකට අදාල එකතුව රු47,954 ක් වූ ණයහිමි ශේෂ 04 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

---------------------------------------------

පහත සඳහන් ගිනුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 33,084,089 | ඉඩම් සහ ගොඩනැගිලි ලේඛණය |
| මෝටර් වාහන | 7,085,137 | මෝටර් වාහන ලේඛනය |
| සාමාන්‍ය ගබඩා තොග | 75,118 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ආදායම් ණය ගැතියෝ | 2,066,660 | සනාථ කිරීමේ ලිපි |
| ණය හිමියෝ | 1,074,441 | ණයහිමි ලෙජරය |

1.3.4 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව ---------------------------------------- | අනුකූල නොවීම ----------------------

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි

(i) මු.රෙ. 237 - නිකුත් කළ නමුත් වර්ෂ 02 කට අධික කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු.18,152 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් නිසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) මු.රෙ. 432(1) - 2013 වර්ෂයේදී වාහන අළුත්වැඩියාව සඳහා රු.67,065 ක මුදලක් වැයකර තිබුණු නමුත් මෙම වියදම් වාහන ලොග් පොතෙහි සටහන් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
---------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.2,518,975 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.166,307 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය රු. 2,352,668 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම
-------------------------------------------------------------------

සභාව විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තගත | තථ්‍ය | දෙසැම්බර් 31 දින සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් සහ බදු | 301 | 382 | 81 |
| (ii) | කුලී | 678 | 647 | (31) |
| (iii) | සේවා ගාස්තු | 953 | 2,640 | 1,607 |
| (iv) | වෙනත් ආදායම් | 366 | 358 | 08 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සහ බෙදා හැරීමේ උපමාන පාදක වැඩසටහන යටතේ රු.498,475 කට බැරල් 157 මිලදී ගැනීම සම්බන්ධයෙන් 2014 සැප්තැම්බර් 07 දින විගණන පරික්ෂණයක් සිදුකරන ලදී. තෝරාගෙන තිබූ ප්‍රතිලාභීන් 10 දෙනා අතරින් 03 දෙනෙකු බහාළුම් ලබාගෙන නොතිබුණු බවත්, බහාළුම් ලබාගත් 07 දෙනාද 2014 සැප්තැම්බර් 07 දින වනවිටත් එම බහාළුම් අපේක්ෂිත අරමුණු සඳහා යොදවා ගෙන නොතිබුණු බවත් එහිදී නිරික්ෂණය විය.

(ආ) සභාවට අයත් කැබ් රථය අළුත්වැඩියා කිරීම සඳහා රු.198,500 ක මුදලක් වැය කර තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

i. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකොට අළුත්වැඩියා කටයුතු සිදුකර තිබුණි.
ii. 2014 සැප්තැම්බර් 09 වන තුරුත් යාන්ත්‍රික ඉංජිනේරුවරයාගෙන් තක්සේරු ඇගයුම් සහ අවසන් වාර්තාව ලබාගෙන නොතිබුණි.
iii. ප්‍රාදේශීය සභා මූල්‍ය රීති ප්‍රකාරව සහතික කිරීමේ නිලධාරියාගේ සහතික කිරීමක් නොමැතිව ගෙවීම් සිදුකර තිබුණි.
iv. චෙක්පත් නිකුත් කිරීමේ ලේඛණයේ සටහන් නොකොට මෙම චෙක්පත නිකුත් කර තිබුණි.

(ඇ) වටිනාකම රු. 178,145 ක් වූ පරිගණකයක් ජල පෙරන උපකරණයක් සහ ජල සැපයුම් උපාංග මිලදී ගැනීම පිළිබඳව සිදුකළ පරික්ෂණයකදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

i. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

ii. ප්‍රාදේශිය සභා රීති (මූල්‍ය සහ පරිපාලන ) අංක 99 ප්‍රකාරව සහතික කිරීමේ නිලධාරියාගේ සහතික කිරීමක් නොමැතිව ගෙවීම් කර තිබුණි.

iii. චෙක්පත් නිකුත් කිරීමේ ලේඛණයේ සටහන් නොකොට මෙම චෙක්පත නිකුත් කර තිබුණි.

iv. ප්‍රාදේශිය සභා මුදල් රෙගුලාසි අංක 115 ප්‍රකාරව මිළදී ගත් විෂයයන් වට්ටෝරු භාණ්ඩ ලේඛණයේ සටහන් කර නොතිබුණි.

(ඇ) 2013 ජුනි සිට දෙසැම්බර් දක්වා සාමාජිකයන්ට නිකුත් කර තිබූ පුස්තකාල පොත් 87 ක් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද සාමාජිකයන් නොවන දෙදෙනෙකුට පොත් නිකුත් කර තිබුණු අතර සාමාජිකයන් 42 ක් විසින් ඉදිරිපත් කර තිබූ අයදුම්පත් අසම්පූර්ණ ඒවා විය. වගකීම් පැහැරහැරි කියවන්නන් පිළිබඳ නිවැරදි තොරතුරු ලබාගැනීමට නොහැකි විය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

(අ) ළමා උද්‍යාන ඉදිකිරීම

-------------------------

ළමා උද්‍යානයක් ඉදිකිරීම සඳහා 2013 ජනවාරි 16 දින වෙරුගල් ප්‍රාදේශිය සභාව විසින් ගිවිසුමක් අත්සන් කර තිබුණි.

i. ගිවිසුම අනුව ඉදිකිරීම් නිම කළ යුතු දිනය 2013 මාර්තු 01 දින වුවත් 2013 සැප්තැම්බර් 05 දින වන විටත් මෙම කොන්ත්‍රාත් වැඩ සම්පූර්ණ කර නොතිබුණි.

ii. රු.3,526,216 ක් වූ කාර්ය සාධන ආරක්ෂක බැඳුම්කරය 2013 මාර්තු 28 දින කල් ඉකුත් වී තිබුණි. කෙසේ වුවද කාර්ය සාධන ආරක්ෂක බැඳුම්කරය අළුත් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

iii. ළමා උද්‍යානයේ උපකරණ සකස් කර ස්ථාපිත කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට රු.1,930,800 ක මුදලක් ගෙවා තිබුණු නමුත් විගණන පරීක්ෂණ දිනය වනවිටත් උපකරණ ස්ථාපිත කර නොතිබුණි.

iv. කොන්ත්‍රාත්කරු විසින් ප්‍රධාන ගේට්ටුව ඉදිකිර නොතිබුණු නමුත් ගේට්ටුව සවිකළ බවට සහතික කරමින් කොන්ත්‍රාත්කරුට රු.20,538 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) ඉලන්කෙයිතුරෙයි සිට පුල්මුඩෙයි දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

---------------------------------------------------------------------------------

ඉහත සඳහන් ප්‍රතිසංස්කරණ සඳහා වූ කොන්ත්‍රාත්තුව 2012 ජනවාරි 10 දින රු.11,538,793 ක් වූ වටිනාකමට පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

i. කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කළයුතු දිනය 2012 අප්‍රේල් 10 වේ. කෙසේ වුවද නිමකළ වැඩ සඳහා රු.1,204,560 ක් ලබා ගැනීමෙන් පසුව කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණි.

ii. කොන්ත්‍රාත්කරු රු.2,307,000 ක් ලබා ගැනීමෙන් පසු කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණි. අත්තිකාරම් බැඳුම්කරය කල් ඉකුත් වීමට පෙර මුදල් කර ගැනීමට ප්‍රාදේශිය සභාව අපොහොසත් වී තිබුණු අතර එබැවින් සභාවට රු.2,307,000 ක් වූ පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ) පුන්නිදාය් ඉරන්කතුරෙයි මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා කොන්ක්‍රීට් ගල් ඇතිරීම.

-------------------------------------------------------------------------------------------

රු.17,686,256 ක් වටිනා ඉහත සඳහන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2012 අප්‍රේල් 03 දිනදී ප්‍රදානය කර තිබුණු අතර මාස 3 ත් ඇතුළත ඉදිකිරීම් නිමකළ යුතු විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඉදිකිරීම් කටයුතු 2012 අගෝස්තු 04 දිනට පෙර නිම කළ යුතුය. නමුත් නිම කළ වැඩ සඳහා රු.1,655,251 ක මුදලක් ලබා ගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරු වැඩ නවතා දමා තිබුණි.

ii. කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබූ නමුත් සභාව විසින් රු.884,313 ක් වූ කාර්යය සාධන ඇපකරය මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 ඌණ උපයෝජිත වත්කම්

-------------------------------

ඌණ උපයෝජක වත්කම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් විෂයය | වටිනාකම | ඌන උපයෝජිත වත්කම් |
|---|---|---|
| | රු.000 | |
| රෝද 4 ට්‍රැක්ටරය | 500,000 | වර්ෂ 04 |
| රෝද 2 ට්‍රැක්ටරය | අගය කර නැත | වර්ෂ 04 |
| වෙළඳ පොල සංකීර්ණය | 2,272,800 | වර්ෂ 02 |

3.4 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විධායක | 01 | - | 01 | - |
| සභායක | 15 | 12 | 03 | - |
| සුළු සේවක | 30 | 13 | 17 | - |
| වෙනත් | - | 33 | - | 33 |

වර්ෂ 05 කට අධික කාලයක් පුරප්පාඩුව පැවතුණු විධායක ශ්‍රේණියේ තනතුර සහ කළමනාකරණ සහකාර තනතුරු 03 ක පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

4. පද්ධති සහ පාලන

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) අත්තිකාරම් අයකර ගැනීම
(ඈ) ආදායම් එකතු කිරීම
(ඉ) ප්‍රසම්පාදන පරිපාටිය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය